# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2128/8 - 2019 ජුනි මස 18 වැනි අඟහරුවාදා - 2019.06.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

හරීන් ප්‍රනාන්දු,
විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය.

2019 මැයි මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(01) III වන කොටසෙහි අංක 7. හි (xvii) වගන්තිය සහ එහි සංශෝධන වශයෙන් 2017 පෙබරවාරි මස 13 වන දින නිකුත් කර ඇති අංක 2006/13 *අති විශෙෂ ගැසට් නිවේදනයේ* අංක 7. (ඇ) සංශෝධිත වගන්ති ඉවත් කොට පහත වගන්ති ආදේශ කිරීමෙන් ;

**7. (xvii)** වගන්තිය

(අ) නාමිකයන්ගේ නම් ලැයිස්තුව සමග වාර්ෂික මහාසභා රැස්වීමට පැමිණ ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම ඇති අනුබද්ධ ආයතන වල ඡන්දදායක නාම ලේඛනය ද, කලින් මුදල් වර්ෂයේ විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද ගිණුම් වාර්තාවේ පිටපතක් හෝ විගණකාධිපතිවරයා විසින් නම් කරන ලද විගණන ආයතනය මගින් විගණනය කරන ලද අදාළ මුදල් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයේ පිටපතක්, එම මුදල් වර්ෂයට අදාළ සභාපති, ලේකම් හා භාණ්ඩාගාරිකවරයා විසින් සහතික කර එහි පිටපතක් ද ඇතුළත් දැනුම් දීමක් වාර්ෂික මහා සභා රැස්වීමට අවම වශයෙන් දින 14 කට පෙර එහි අනුබද්ධ ආයතන වෙත ඉදිරිපත් කිරීම.

(ආ) මහාසභා රැස්වීම පැවැත්වීමේ දී ගිණුම් වාර්තාව වශයෙන් විගණකාධිපතිවරයා විසින් නම් කරන ලද ආයතනය මගින් විගණිත මූල්‍ය ප්‍රකාශනයේ පිටපතක් ඉදිරිපත් කරන්නේ නම්, ඉදිරියේ දී විගණකාධිපතිවරයා විසින් විගණිත මූල්‍ය ප්‍රකාශය ලැබුණු පසු අදාළ මූල්‍ය වර්ෂයේ නිලතල දරන ලද සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරිකවරයා විසින්, එය සහතික කොට දින 14 ක් තුළ අදාළ අනුබද්ධ ආයතනයන් වෙත යොමු කොට අදාළ මුදල් වර්ෂයේ සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරිකවරයා ද වර්තමාන විධායක කමිටුවද සහභාගී වන විශෙෂ මහා සභා රැස්වීමකින් සම්මත කර ගැනීමට යටත්ව එම මහා සභා රැස්වීමේ දී සම්මත කර ගත යුතු ය. කෙසේ වුවද විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද වාර්තාව අවසන් ගිණුම් වාර්තාව වශයෙන් සැලකිය යුතු ය.

1A - PG 4566 — 517 (2019/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(02) අංක 5.(4) (න) වගන්තිය සහ අංක 7 (XIII) ඉවත් කොට පහත අයිතමය අංක 5.(4) (න) වගන්තියට ආදේශ කිරීමෙන් ;

**5.(4) (න) වගන්තිය**

පෙර වර්ෂයන්හි විගණිත මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අසමත් වූ හෝ එසේ කිරීම පැහැර හැර ඇති ජාතික ක්‍රීඩා සංගමයක අදාළ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අගෝස්තු මස 31 වන දිනට ප්‍රථම විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර එම මූල්‍ය ප්‍රකාශයන් විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් විගණනය කර ලබා ගන්නා තෙක් සහ පෙර වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශයන් මේ දක්වා විගණනය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට ඇත්නම්, තනතුරු සඳහා අයදුම් කිරීමට හා පත් වීමට හැකි අතර එම ගිණුම් වාර්තාවන්ගේ මූල්‍ය වංචාවක්/අවභාවිතාවක් සිදුවූ බවට හෝ පෙර වර්ෂයක ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීම පැහැර හැර ඇත්නම් ගරු අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන විධිමත් පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන පරීක්ෂණයකින් වරදකරුවකු වන ජාතික සංගමයක සභාපති, ලේකම් හෝ භාණ්ඩාගාරික හෝ චෙක්පත් අත්සන් කරනු වෙනත් නිලධාරියකු වේ නම් ;

හරින් ප්‍රනාන්දු,
විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය.

2019 මැයි මස 29 වැනි දින,
කොළඹ දී ය.

07 - 27

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.